# නොබිඳුණු මිතුදම



සඳුනි ආරියසේන

# නොබිඳුණු මිතුදම

(මිතුදමක අරුමය)

සඳුනි නවෝද්‍යා ආරියසේන

නොබිඳුණු මිතුදම
(මිතුදමක අරුමය)

සඳුනි නවෝද්‍යා ආරියසේන

මහාමායා බාලිකා විදුහල

8 ශ්‍රේණිය G

2025-02-08

ISBN : 978-624-208-667-5

# පිදුම

මා හට සිප් සතර පාදා දෙන ගුරුමෑණි

පියවරුනි, මාගේ ආදරණීය දෙමාපියනි,

මාගේ මෙම පුස්තකය සාදා ගැනීමට

උදව් උපකාර කළ ඔබ සැමට

ගෞරවයෙන් මෙම පුස්තකය

පුදන්නෙමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරළඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණි**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකමත් එක ගමක හිටියා ලස්සන පුංචි ගැහැණු ළමයෙක්. මේ පුංචි ගැහැණු ළමයාගේ නම සෙලීනා. සෙලීනාට හිමි වෙලා තිබුණේ කෝපි පාට සමක්. කිරිගරුඬ මෙන්ද නොමැති කළු ගලක් මෙන්ද නොමැති ඒ සම අලුතෙන්ම කෝපි පාටයි. සෙලීනා කැරලි ගැසුණු දිගු කොණ්ඩයකටද, බෝනික්කියෙකුගේ මෙන් බෝල දෑස් දෙපලකටද කිරි පාට දත් දෙපලකටද උරුමකම් කියනු ලැබුවා. පුංචි සෙලීනාගේ දෙමාපිටන්ට සිටියේ අෑ පමණයි.

ඔව් ඔබ නිවැරදි ඇයට සහෝදර සහෝදරියන් කිසිවෙකු සිටියේ නෑ. පවුලේ එකම දරුවා වූ ඇය තම දෙමාපියන්ගේ මෙන්ම පවුලේ සියලු ඥාතීන්ගේ පුංචි කුමාරිකාවයි. එසේම සුරතලියයි.



සෙලීනාගේ පියා වූ ඇලෙක්ස් රජයේ ආයතනයක සේවයේ නියුතු පුද්ගලයෙකි. ඇගේ මව ඈන් පෞද්ගලික ආයතනයක ලිපිකරු සේවයේ නියුතු අයෙකි. සාමාන්‍ය ආර්ථික තත්වයක් තිබුණද ඔවුන් තිදෙනා ජීවත් වූයේ ඉතා සතුටිනි. කළු සහ සුදු පැහැති දිගැති රෝම කූපවලින් යුතු එමී සෙලීනාගේ නිවසේ සිටි අනෙක් කුඩා සාමාජිකයා ය. නිතර තනිවම කාලය ගෙවන සෙලීනාගේ පස්වන උපන්දින තෑග්ග වූයෙ එම සුරතල් පූස් පැටවායි. මව සහ පියා රැකියාවට පිටව ගිය විට සෙලීනා කාලය ගත කලේ පුංචි එමී සමඟයි.



සෙලීනා නිතර දෙවේලේ පුරුදුව සිටියේ පිටි අධික මෙන්ම පැණි රස බිස්කට්, පාන්, චොකලට් වැනි කඩ කෑම ආහාරයට ගැනීමටයි. එනිසාම ඇය ඇගේ වයසේ අනෙකුත් මිතුරියන්ට වඩා මහත් ශරීරයකින් යුක්තව සිටියා. ඇගේ මහත ශරීරය නිසා යම් අවස්ථාවන්හිදී ඇය මිතුරියන් අතරේ විහිලුවට ලක් වූවා.


''පැටියෝ ඔය තරම් ටොෆි, චොකලට් කන්න එපා. ඔයා තවත් මහත් වෙයි. මම නම් දන්නේ නෑ ඔන්න.'' එසේ නිරන්තරයෙන් පවසන්නේ ඇගේ මවයි.

''අයියෝ අම්මි කන්න ඕනි. බොන්න ඕනි. බෝලේ වගේ ඉන්න ඕනි'' ඒ සෙලීනාගේ හුරතල් කතා.

''ආ.... ඇත්තද මගේ පුංචි පණ්ඩිතී''

සෙලීනා කුඩා කාලයේ මව සහ පියා රැකියාවට ගිය විට ඇව රැක බලා ගත්තේ ඇගේ අත්තම්මලා දෙන්නා මෙන්ම අම්මාගේ නංගිලා. ඒ කියන්නේ සෙලීනාගේ පුංචිලා දෙන්නා. ඒ නිසාම ද මන්දා සෙලීනා අත්තම්මලා දෙන්නාට මෙන්ම පුංචි අම්මලා දෙන්නාට පණ මෙන් ආදරය කළා.

ඇගේ පෙර පිනක් නිසාමදෝ මන්දා ඇයට බාධාවක් නොමැතිවම පළමු ශ්‍රේණියේදී තම මව පෙර ඉගෙනුම ලැබූ පාසලට ඇතුළු වීමට වාසනාව හිමි වෙනවා. එම පාසලෙන් තම පාසල් ජීවිතය ආරම්භ කළ සෙලීනාට ඇ මෙන්ම හුරුබුහුටි, පුංචි මිතුරියන් සතර දෙනෙකු මුණ ගැසුණා. වින්ඩි, ඔමේලියා, බිමෙලි හා තිසෙල්යා ඒ මිතුරියන් සතර දෙනාය.



කාලය කෙමෙන් කෙමෙන් ගත වන විට මේ පුංචි මිතුරියන් පස්දෙනා අඹ යාළුවන් නැතහොත් හොඳම මිතුරියන් බවට පත් විය. එකිනෙකාට එකිනෙකා නොදැක සිටීමට නොහැකි තරම් විශාල බැඳීමක් ඔවුන් අතර ඇති විය. එක මවකගේ දරුවන් නොවුණද ඔවුන් අතර තිබූ සම්බන්ධය සහෝදර බැඳීමක් තරම් ශක්තිමත් බැඳීමකි.

කුඩා කෑමක් ලැබුණද, එය යහළුවන් පස්දෙනා අතර බෙදා ගැනීමට, දිවා ආහාරය එක්ව ගැනීමට ඔවුන් පුරුදුව සිටියා. එමෙන්ම මෙම පුංචි මිතුරියන් පස් දෙනා උදවු අවශ්‍ය අනෙකුත් තම මිතුරියන් හට උදව් උපකාර කිරීමට බොහෝ සේ ප්‍රිය කළා. තමන්ට හැකි අයුරින් උදවු අවශ්‍ය යාළුවන්ට, පුද්ගලයන්ට උදවු ලබා දුන්නා. එනිසාම මෙම පුංචි යාළුවෝ පසු දෙනා තම පන්ති කාමරය තුළ කැපී පෙනෙන චරිත බවට පත් වූවා. පන්තිභාර ගුරුතුමියගේද ප්‍රසාදයට ලක් වුණා.

කාලය කෙමෙන් කෙමෙන් ගත වූවා. අනෙකුත් දෙමව්පියන්ට මෙන්ම මොවුන්ගේ දෙමාපියන්ටද ශිෂ්‍යත්ව උණුසුම දැනෙමින් තිබුණා. මොවුන්ගේ දෙමාපියන් යහළුවන් පස්දෙනාම එක් ශිෂ්‍යත්ව පන්තියකට යොමු කිරීමට කටයුතු කළා.

''මට නම් දැන් එපා වෙලා තියෙන්නේ. එක දවසක්වත් ගෙදරට වෙල ඉන්න නෑනේ. පන්ති, පන්ති, පන්ති මොන කරදරයක් ද මන්දා'' ඒ තිසෙල්යා.

''මටත් එපා වෙලා තියෙන්නේ. සෙනසුරාදා දවසම පන්ති. සෙල්ලම් කරන්නවත් වෙලාවක් නෑ. හැම වෙලේම පාඩම් පාඩම් පාඩම්'' එහෙම කියන්නේ වින්ඩි.

''ඒක ඇත්ත තමයි යාළුවනේ. ඒත්... අපේ අම්මලාට ඕනේ අපිට හොඳට උගන්නලා ශිෂ්‍යත්ව විභාගය සමත් කරවලා හොඳ ඉස්කෝලෙකට දාන්නනේ'' ඒ විදිහට තමන්ගේ යහළුවන්ට උපදෙස් දෙන්නේ පුංචි සෙලීනා.

''හ්ම්ම්... එහෙනම් අපි ඔක්කොමලාම හොඳට වැඩ කරලා ශිෂ්‍යත්ව විභාගය සමත් වෙමු. එතකොට අපේ අම්මලාටත් සතුටු හිතෙයිනේ''

යාළුවෝ පස්දෙනා එහෙම හිතලා හොඳට වැඩ කරන්න පටන් ගත්තා. ශිෂ්‍යත්ව විභාගය කියන්නේ කඩයිම් විභාගයක්. මේ විභාගය ළමයින්ගේ විභාගයක් නොවේ. අම්මලාගේ විභාගයක් කියලා තමා හැමෝම කියන්නේ. ශිෂ්‍යත්ව විභාගයට ළමයින්ව උනන්දු කරවන්න ඕනි. ළමයිනුත් උනන්දු වෙන්න ඕනි. නමුත් ළමයින්ට අනවශ්‍ය ලෙස පීඩනයක් ලබා නොදිය යුතු බව තමයි මම නම් හිතන්නේ.

''කාලය රන් හා සමානයි'' කියන කියමන තේරුම් ගත් නිසාමදෝ මන්දා මේ පුංචි යහළුවෝ පස්දෙනා උනන්දු වෙලා වැඩ කරන්න පටන් ගත්තා. තමන් නොදන්නා දේවල් යහළුවන්ගෙන් අසා අවබෝධ කර ගත්තා. තමා දන්නා සියලු දේ තමන්ගේ මිතුරන්ට කියා දීමට උත්සාහ කළා. එනිසාම මේ පුංචි හපන්නු පස් දෙනාගේ දැනුම තවතවත් වර්ධනය වුණා.


ඔය විදිහට කාලය ගෙවිලා යනකොට ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන දවස උදා වුණා. යාළුවෝ පස් දෙනාම උදෙන්ම නැගිටලා, පිරිසිදු වෙලා, බුදුන් වැඳලා, තමන්ගේ දෙමාපියන්ගේ ආශිර්වාදයත් රැගෙන විභාගයට මුහුණ දීමට නිවසින් පිටත් වුණා. පුංචි යාළුවෝ පස්දෙනාම මෙතෙක් කල් තමන් ලැබූ දැනුම ප්‍රයෝජනයට අරගෙන හැකි උපරිමයෙන් ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දුන්නා. විභාගය අවසන් වී ටික කලක් ගත වන විට විභාග ප්‍රතිඵල නිකුත් වුණා. මේ පුංචි හපන්නු පස්දෙනා ඉහළින්ම විභාගය සමත් වෙලා.

පුංචි යාළුවෝ වගේම ඔවුන්ගේ දෙමාපියනුත් ගොඩක් සතුටු වුණා. සෙලීනාට ලකුණු 183 යි, ඔමේලියාට 179යි, වින්ඩිට 174යි, බිමෙලිට 165 යි, තිසෙල්යාට 163 යි. සෙලීනාට හා ඔමේලියාට නගරයේ තිබුණ ප්‍රසිද්ධම විශාලම බාලිකා පාසලට ඇතුළත් වීමට අවස්ථාව ලැබෙනවා. වින්ඩිටත් ප්‍රසිද්ධ පාසලකට ඇතුළත් වීමට අවස්ථාව ලැබෙනවා. නමුත් බිමෙලි සහ තිසෙල්යා ඉදිරියටත් තම පාසලේම අධ්‍යාපනයේ නිරත වීමට තීරණය කරනවා.

මේ පුංචි හපන්නු පස්දෙනාම ඉංග්‍රීසි මාධ්‍යයෙන් (English Medium) තම ඉදිරි කටයුතු සිදුකිරීමට තිබූ උනන්දුව නිසාම ඔවුන්ගේ දෙමාපියනුත් ඔවුන්ට ඒ සඳහා අවසරය ලබා දෙනවා. සෙලීනා, ඔමේලියා සහ වින්ඩි ඔවුන්ට පාසලක් ලැබෙන තෙක් මාසයක් පමණ කාලයක් බිමෙලි සහ තිසෙල්යා සමඟ ඔවුන් පෙර ඉගෙනුම ලැබූ පාසලේම ඉංග්‍රිසි මාධ්‍යයෙන් අධ්‍යාපනයේ නිරත වෙනවා. එලෙස ටික කලක් ගත වන විට යාළුවන් පස්දෙනාට වෙන් වීමට සිදු වූ දිනය උදා විය. අවුරුදු 5කට ආසන්න කාලයක් තම දුක සැප බෙදා ගනිමින් සහෝදරියන් මෙන් සිටි මේ පුංචි යාළුවෝ පස්දෙනාට වෙන්වීම ඉතාමත් අපහසු, දරා ගත නොහැකි කාර්යයක් විය. වෙන්වීමට තිබූ දුක නිසාම යාළුවන් පස් දෙනා බොහෝ වේලාවක් හඬා තම දුක සිංසිදවා ගත්තා.

සෙලීනා සහ ඔමේලියා සමඟ ඔවුන් පෙර අධ්‍යාපනය ලැබූ පාසලේ අධ්‍යාපනය ලැබූ සෙශිනිටද ඔවුන් සමඟ නව පාසලට ඇතුළත් වීමට වාසනාව ලැබිණි. නව පාසලට ඇතුළත් වූ පසු ඔමේලියාට සහ සෙශිනිට ඉංග්‍රීසි මාධ්‍යය තෝරා ගැනීමේ විභාගයෙන් සමත් වීමට හැකියාව ලැබුණු නමුත් සෙලීනාට ඒ සඳහා අවස්ථාව නොලැබිණි. ඒ බව දැනගත් සෙලීනා තම පොත්පත් සියල්ල තම දෝතට ගෙන හැකි පමණින් හඩා වැලපී දුක තුනී කර ගත්තාය. ඔමේලියා සහ සෙශිනි ඉංග්‍රීසි මාධ්‍යය පන්තියකටද සෙලීනා සිංහල මාධ්‍ය පංතියකටද ඇතුළත් වූ පසු ඔමේලියා සහ සෙලීනා අතර තිබූ මිතුදම කෙමෙන් කෙමෙන් දුරස් විය. පාසලේ කොහේදී හෝ සෙලීනාව මුණගැසුණු විට ඇයට සිනාවකින් පමණක් සංග්‍රහ කිරීමට ඔමේලියා පුරුදු විය. සෙලීනා ඈ සමඟ නිරන්තරයෙන් කතා කිරීමට උත්සහ කළත් එය මඟහැර යෑමට ඔමේලියා උත්සහ කළේ මන්දැයි කිසිවකු නොදනී. සෙලීනාට එයින් බොහෝ දුකක් ඇති වුවත් ඒ පිළිබඳව නොසිතා සිටීමට ඇය උත්සාහ දැරිය

ටික කලක් ගත වන විට ඉහත සඳහන් කල තත්වය නැවතත් යථාතත්වයට පත් වී සෙලීනා හා ඔමේලියා අතර තිබූ මිතුදම තව තවත් වර්ධනය විය. සෙලීනා හා ඔමේලියා අතර විරසකයක් ඇති වීමට බලපෑ ප්‍රධානම හේතුව වූයේ සෙෂිනිය. සෙලීනා හා ඔමේලියා අතර තිබූ අපූරු මිතුදම ඉවසා ගත නොහැකිව ඔවුන් දෙදෙනා විරසක කිරීමට සෙෂිනි ගත් උත්සාහය සහ ක්‍රියාමාර්ග දැන ගත් විගස ඔවුන්ට සෙෂිනි පිළිබඳව වෛරයක් ඇති වුවත් වෛරයෙන් වෛරය නොසිදෙන බව දන්නා නිසාම ඔවුන් එය පාලනය කර ගැනීමට උත්සාහ දැරීය



විවිධ උත්සාහයන් ගැනීමෙන් 7 ශ්‍රේණිය ආරම්භ වන විට ඉංග්‍රිසි මාධ්‍යය පන්තියට ඇතුළත් වීමට සෙලිනාට වාසනාව ලැබිණි. ඒ සඳහා ඇයට ඇයගේ දෙමාපියන්ගෙන් මෙන්ම 6 ශ්‍රේණියේ පන්තිභාර ගුරුතුමියගෙන් විශාල පිටුවහලක් ලැබිණි.

ඔමේලියා සහ සෙශිනි සිටි පන්තියටම ඇතුල්වීමට සෙලිනාට හැකි විය. ඔමේලියා හා සෙශිනි සෙලිනා පන්තියට පැමිණි මුල් දිනයේ කතා නොකලේ මන්දැයි ඈ නොදනී. සෙලිනා සමඟ කතා කිරීමට, සිනාසීමට, පුටුවක් සහ මේසයක් සොයා දීමටවත් මිතුරියක් එහි නොවීය. දිනක් ඈ සෞන්දර්ය විෂය සඳහා නර්තන කාමරයට ගොස් නැවත පන්තියට පැමිණෙන විට ඇගේ බෑගය තිබූ ස්ථානයේ නොතිබිණි. එය පන්තියේ මුල්ලකට දමා තිබිණ. මෙය සිදු කළේ කවුරුන්දැයි ඈ නොදනී. එය සෙවීමටවත් ඈ උත්සහ නොකළාය. තම දෙමව්පියන්ටවත් නොකියා එය තනිව දරා ගැනීමට ඇය උත්සාහ දැරීය. සති ගණනාවක් ඇය මිතුරියක නොමැතිව තනිවම කල් ගත කලාය. නමුත් එක් දිනක් සෙශිනි ඈ සමඟ කතාබහ කොට ඈ සමඟ මිතුරු වීමට උත්සාහ දැරීය. මිතුරියක නොමැතිව සති ගනණාවක් ශෝකයෙන් තනිව සිටි ඇය කිසිවක් නොසිටි සෙශිනි සමඟ මිතුරු විය. නමුත් මේ ආරම්භ වූයේ නපුරු කාලයක් බවත් ඈ මිතුරු වූයේ නරක මිතුරෙකු සමඟ බවත් ඈ දැන සිටියේ නැහැ. මේ වන විට සෙශිනිට මිතුරියක් සිටියා. ඇගේ නම නිමේකාය. නිමේකා ඉතා ආත්මාර්ථකාමි නපුරු අයෙකි. එය ඇගේ මුහුණෙන්ම දක්නට ලැබිණි. දිනක් සෙශිනි තමන්ට අනෙක් පස තිබූ හිස් අසුනට පැමිණෙන ලෙස සෙලිනාට දැන්වීය. නමුත් නිමේකා එයට අකමැති විය. ඒ බව නොදත් සෙලිනා එය අසුනට පැමිණියේ ඉතාමත් සතුටිනි

''සෙලීනා මෙතන නිමේකාට එහා පැත්තේ පුටුවක් තියෙනවා. එතන කුවරුත් නෑ. ඔයා එතනට එන්න''

''අනේ බොහොම ස්තූතියි, සෙශිනි ඉන්න. මම එන්නම්'' සෙලීනා ඉමහත් සතුටට පත්විය.

''අයියෝ සෙශිනි ඔයා මොකද එයාට මෙතනට එන්න කිවුවේ. ෂික් එපා වෙනවනේ''

''අනේ නිමේකා එයා පවුනේ''

''පව්. එයා නෙවේ මම. මං එපැයි දැන් මෙතන ඉන්න''

ඊළඟ කාලච්ඡේදයේදී ඔවුන්ට තිබුණේ ඉතිහාසය විෂයයි. එය අවස්ථාවේ නිමේකා සෙලීනා සිටි පුටුව සහ මේසය නිමේකාගේ මේසයෙන් තරමක් ඈත් කළාය. එම අවස්ථාවේ කුමක් නිසාදෝ මන්දා පුංචි සෙලීනාගේ දෑසින් කඳුළක් පිටවිය. මේසය ඈත් කර තිබූ බව දුටු ඉතිහාස විෂය භාර ගුරුතුමිය ඔවුන් අසළට පැමිණ සිදු වූ දෙය විමසූවත් සෙලීනා කිසිවක් නොවූ බව ඇයට පැවසීය.

''ඇයි පුතේ, මේ මේසේ ඈත් කරලා. තරහා වෙලාද?''

''නෑ මැඩම් තරහා වෙලා නෑ. මේ නිකන්''

''හ්මිම්... හ්මිම්... එහෙනම් කමක් නෑ''

ගුරුතුමියට සෙලීනාගේ ඇසේ වූ කඳුළු හඳුනා ගැනීමට නොහැකි වූයේ ඇය මුඛ ආවරණයක් පැළඳ සිටි නිසා විය හැක. දිනක් සෙඟිනි නිමේකා හා එක්ව සෙලීනාට

''මේ නිමේකා ඔයා දන්නවාද 7B එකේ ඉන්නවා ළමයෙන් මාර පණ්ඩිතයි''

''අපෝ ඔව් ඔව්. මං දන්නවා. එයා හිතන් ඉන්නේ හැමදේම දන්නවා කියලා.''

''කියලා වැඩක් නැහැ''

ඔවුන් ඒ සියල්ල පවසන්නේ තමන්ට බව දැන දැනත් සෙලීනා මේ කිසිවක් නෑසුණා මෙන් තමන්ගේ රාජකාරියේ නිරත විය. දින ගණනාවක් මොවුන් මේ කාර්යය සිදු කරන විට සෙලීනාටද ඉවසා ගත නොහැකි විය. ඒ නිසාම ඇය කිසිවකු නොසිටි ස්ථානයකට ගොස් හැකිතරම් හඬා ඇගේ දුක නැති කර ගත්තාය.

7 ශ්‍රේණියේදී යහළුවන් විසින් සිදු කල නොමනා ක්‍රියා නිසා 2 වන හා 3 වන වාරයේහිදී සෙලීනාගේ ලකුණු මට්ටම සහ ප්‍රගතිය පහලට වැටුණි.

8 ශ්‍රේණියට පිවිසෙන විට අංශභාර සහ විදුහල්පතිනියගේ තීරණයක් මත පන්ති මිශ්‍ර කිරීමට (Shuffel) තීරණය කෙරුණි. එහිදී ඔමේලියාගේ මිතුරිය හා ඔමේලියා වෙන් විය. නමුත් සෙගිනි ඔමේලියා හා ශෙලිනා එකම පන්තියට වැටුණි. මෙහිදී නැවතත් සෙලීනා ඔමේලියාගේ හොඳම මිතුරිය බවට පත්විය. ඔවුන් අතර තිබූ මිතුදම ශක්තිමත් විය. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඔවුන් සිටි ආකාරයට සිටීමට ඔවුන් ගත් උත්සාහය සාර්ථක විය. ඔවුන් දෙදෙනා අතර තිබූ මිතුදම කඩා බිඳ දැමීමට කිසිවෙකුට නොහැකි විය. සෙලීනා සහ ඔමේලියා නිවේදනයට ඉතාමත් ප්‍රියය. දෙදෙනාම කථිකත්වයට මහත් සේ දක්ෂය. ඔවුන් දෙදෙනා අතර වූ එකම වෙනස වූයේ ඔමේලියා ගායනයට උපන් හපනෙකි.

නමුත් සෙලීනා ගායනයට නොව නර්තනයට හා චිත්‍ර ඇඳීමට උපන් හපනෙකි. කෙසේ වෙතත් මෙය ඔවුන්ගේ මිතුදමට කිසිම බාධාවක් නොවීය



මෙලෙස වසර 2 ක් පමණ ගතවන විට සෙලීනාගේ ජීවිතයේ අදුරුම කාල පරිච්ඡේදය ආරම්භ විය. එවිට සෙලීනා ඉගෙනුම ලැබුවේ 10 ශ්‍රේණියේ O/L විභාගයට පැවතුණේ මාස 04 ක පමණ කාලයක්. නොවැම්බර් 25 සෙලීනාගේ ජීවිතයේ නරකම අදුරුම දවසයි. උදෑසන අවදි වී දෙමාපියන් වැද නිවසින් පිට වූ සෙලීනා නැවත නිවසට පැමිණෙන විට ප.ව. 5.00 ට පමණ විය. මුළු ගෙදරම වෙනදාට වඩා නිහැඬියාවක් අරගත් නිසා සෙලීනා කලබල විය. නිවස ඇතුළට පා තැබූ සෙලීනාට දැක ගැනීමට හැකි වූයේ ඥාතීන් අතර නිසලව වැතිර සිටින තම මෑණියන්වයි. ඔව් ඒ වන විට සෙලීනාගේ මව මෙලොවින් සමුගෙන

තිබුණා. සෙලිනා දැඩි ලෙස කම්පාවට පත්වුණා. සෙලිනාගේ පියාටවත් සෙලිනාව පාලනය කරගැනීමට හැකි වූයේ නෑ.

ගෙදර බුදුන් අම්මා. අම්මා නැති නිවසින් ඵලක් නැහැ. දරුවෙකුට මවක් නැති ලොවක් ඵලක් නැහැ. මවකගේ කාර්යය කිරීමට ඇය මෙන් දරුවන්ට ආදරය කිරීමට කිසිම ජගතෙකුට බෑ. අම්මා ගෙදර බුදුන් මෙනි. ගසක මුදුන් මුල මෙනි. ඇගේ ගුණ කීමට අපට වචන ගලපා ගැනීමට නොහැකිය. එයයි ඇත්ත.

තිත්ත ඇත්ත වුවත් සෙලිනාට තම මවගේ අභාවය පිළිගැනීමට සිදු විය. මවගේ අවසාන කටයුතු වලින් පසුව සෙලිනාගේ මානසිකත්වය බිංදුවටම අඩියටම වැටී තිබුණි. මේ අවස්ථාවේ සෙලිනාට ශක්තියක් වූයේ ඇගේ පියා ඥාතීන් හා හොඳම මිතුරිය වූ ඔමේලියාය. O/L විභාගයට මාස 4 ක පමණ කාලයක් පමණක් තිබූ අතර ඇය වෙහෙස මහන්සි වී වැඩ කටයුතු කිරීම ආරම්භ කලේ අන් කිසිවක් නිසා නොව තම පණ බදුවූ මෑණියන්ගේ එකම බලාපොරොත්තුව ඉෂ්ඨ කිරීමේ අදහසිනි. ඇගේ මවගේ බලාපොරොත්තුව වූයේ සෙලිනා O/L සහ A/L විභාගය සමත් වී ප්‍රසිද්ධ විනය ගරුක හිත හොඳ වෛද්‍යවරියක් වීම දැකීමයි

මාස 05 කට පසු,
''අප්පච්චි මම O/L Pass මට A 9 යි.''
''ඔය ඇත්තමද මගේ රත්තරනේ බුදු සරණයි''
''ඔව් අප්පච්චි ඇත්තමයි. මේ බලන්නකෝ''
''මට ගොඩක් සතුටුයි පුතේ. ඔය විදිහටම A/L Pass වෙන්න ඕනි හරිද?''
''අනිවාර්යෙන්ම අප්පච්චි. මම ඒකත් කොහොම හරි කරනවා.

සෙලීනා O/L විභාගයෙන් A සාමාර්ථ 9ක් රැගෙන විභාගය සමත් වෙලා තිබුණා. සෙලීනා පමණක් නොව ඇගේ කල්‍යාණ මිතුරිය වූ ඔමේලියාද A සාමාර්ථ 9ක් ගෙන විභාගය සමත් වී තිබුණා.

''ඔමා මට A 9 යි''
''මටත් සෙලී''
''ශෝක්නේ අපි දෙන්නම Pass ඒකත් A9 ක් ම අරගෙන. මට මාර සතුටුයි ඔමා''
''මටත් සෙලී අපේ කැපවීමේ ප්‍රතිඵල තමයි''

විශාල බාධක හමුවේ A සාමාර්ථ 9 ක් ගැනීම පිළිබඳව සෙලීනාට තමා ගැනම ඇත්තේ විශාල අභිමානයකි.

''අපි A/L ටිත් වඩා හොඳට Pass වෙන්න try කරමු සෙලීනා''
''ඔව් අපි අද ඉදලම වැඩ පටන් ගමු''

''කොහොම හරි අපි දෙන්නම එකටම Campus ගිහින් medical college select වෙමු''
''අනිවාර්යයෙයන්ම ඔමා''

යහළුවෝ දෙන්නා උත්සාහ කරන්නේ A/L විභාගය මීටත් වඩා හොඳින් ඉහළින්ම සමත් වෙන්න.

වසර 2කට පසු,
යාළුවෝ දෙන්නගේ සිහිනය සැබෑ වුණා. ඉහළින් A/L විභාගය සමත් වෙලා පුංචි කාලේ ඉඳලා එකට හිටපු යාළුවෝ දෙන්නා, එකටම Campus ගිහින් එකටම medical college එකටත් select වෙනවා.

අවසානයේදී ඉතාමත් ප්‍රසිද්ධ විනය ගරුක ගුණැත් වෛද්‍යවරු දෙදෙනෙක් බවට පත් වීමට සෙලීනාට හා ඔමේලියාට හැකියාව ලැබෙනවා.

''මිතුදම කියන්නේ හරි අපූරු දෙයක්. යාළුවෙකුට ජීවිතයක් විනාශ කරන්න වගේම ජීවිතයක් සාර්ථක කරවන්නත් පුළුවන්. මේ සමාජයේ යහපත් මිතුරෝ සහ අයහපත් මිතුරෝ යනුවෙන් මිතුරන් දෙවර්ගයක් සිටිනවා. සැම විටම යහපත් මිතුරන් තෝරා ගැනීමට අප කටයුතු කළ යුතුයි.''


Dr. Selina



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්